ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
(සමාගම් අංකය: PB5180)
ඇක්සස් ටවර්ස් ii (14 වන මහල),
නො. 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
දුරකථන:+94 11 2428428 | ෆැක්ස්: +94 11 2438438
විද්‍යුත් තැපැල (Email): info@fairfirst.lk
වෙබ් අඩවිය: www.fairfirst.lk

## රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය (IPID)

## ශීතාගාර තුළ භාණ්ඩ රක්ෂණ ඔප්පුව (Goods in Cold Stores Insurance Policy)

### 1. ආවරණයේ විෂයපථය (Scope of Cover)

ශීතාගාර තුළ භාණ්ඩ රක්ෂණය මගින් ශීතකරණ යන්ත්‍රවලට සිදුවන අහඹු සහ අනපේක්ෂිත හානි හේතුවෙන් ශීතාගාර තුළ ගබඩා කර ඇති භාණ්ඩවලට සිදුවන හානි හෝ පිරිහීම් නිසා ඇතිවන මූල්‍යමය අලාභයන්ගෙන් ආරක්ෂාව සපයයි.

### 2. ආවරණය වන දේ (What is Covered)

යන්ත්‍ර බිඳවැටීම් ඔප්පුව (Machinery Breakdown Policy) යටතේ ආවරණය වන ශීතකරණ යන්ත්‍රවලට සිදුවන හදිසි හානියක් හේතුවෙන් උෂ්ණත්වය අහඹු ලෙස ඉහළ යාම හෝ පහළ යාම, ශීතකරණ වායු (refrigerant fumes) කාන්දුවීම, හෝ ශීතාගාරවල ස්ථිර ව්‍යුහයට සිදුවන අහඹු හානියක් නිසා ඒවා තුළ වායු සාන්ද්‍රණයේ සිදුවන වෙනස්වීම් හේතුවෙන් පමණක් ශීතාගාර තුළ ගබඩා කර ඇති රක්ෂිත භාණ්ඩ පිරිහීමට ලක්වීම හෝ හානිවීම සඳහා මෙම ඔප්පුව මගින් ආවරණය සපයයි.

උපලේඛනයේ (Schedule) සඳහන් කර ඇති භාණ්ඩ සඳහා, ප්‍රකාශිත රක්ෂිත මුදලට සහ අදාළ ඔප්පුවේ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව මෙම ආවරණය අදාළ වේ.

### 3. ආවරණය නොවන දේ : බැලු බැල්මට (What is NOT Covered)

- ගින්න, අකුණු ගැසීම්, පිපිරීම්, ගුවන් යානා ගැටීම්, සොරකම්, ගොඩනැගිලි කඩාවැටීම්, ගංවතුර, ජල කාන්දු වීම්, භූමිකම්පා, නායයෑම්, සුළි සුලං, වැසි කුණාටු, ගිනිකඳු පිපිරීම් හෝ සමාන ව්‍යසන
- අසාමාන්‍ය පරීක්ෂණ, හිතාමතා අධික බර පැටවීම, හෝ පර්යේෂණ

- ඔප්පුව ආරම්භයේදී හෙළි නොකළ දන්නා දෝෂ හෝ අඩුපාඩු
- නුසුදුසු ලෙස ගබඩා කිරීම, දෝෂ සහිත ඇසුරුම් කිරීම, ප්‍රමාණවත් නොවන වායු සංසරණය, හෝ අසමාන උෂ්ණත්වය
- ආවේනික දෝෂ, හැකිලීම, ස්වභාවික පිරිහීම, හෝ භාණ්ඩවල ඇති වන රෝග
- රක්ෂණකරුගේ කැමැත්තකින් තොරව ශීතකරණ යන්ත්‍රවල සිදු කරනු ලබන තාවකාලික අලුත්වැඩියාවන්
- දඩ මුදල්, ආනුශංගික අලාභ (consequential losses), හෝ යම් නීතිමය බැඳීමක්
- ප්‍රධාන විදුලි සැපයුමේ බිඳවැටීම් හෝ උච්චාවචනයන්

## 4. වාරික ගෙවීම (Premium Payment)

සාමාන්‍යයෙන් වසරක් වන ඔප්පු කාල සීමාව සඳහා සම්පූර්ණ වාරිකය (තනි) එකවර ගෙවීමක් ලෙස ගෙවිය යුතුය.

## 5. රක්ෂණකරුගේ බැඳීම් (Policyholders’ Obligations)

හිමිකම්පෑමකට තුඩු දීමට ඉඩ ඇති යම් අහඹු හානියක් හෝ පිරිහීමක් මෙන්ම, අවදානම් මට්ටමට බලපෑ හැකි යම් දෝෂයක් හෝ වැඩ කරන තත්වයන්හි වෙනස්වීමක් පිළිබඳව ෆෙයාෆස්ට් ඉන්ෂුරන්ස් (Fairfirst Insurance) වෙත වහාම දැනුම් දිය යුතුය.

හිමිකම්පෑමකට ලක්විය හැකි සිදුවීමකදී, රක්ෂිත දේපළට තවදුරටත් අලාභ හෝ හානි සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලුම සාධාරණ පූර්වාරක්ෂාවන් ගත යුතුය. හිමිකම්පෑම තක්සේරු කිරීම සඳහා පත් කරන ලද යම් මැනුම්කරුවෙකු, අලාභ තක්සේරුකරුවෙකු හෝ විමර්ශකයෙකු සමඟ මෙන්ම අප සමඟද පූර්ණ සහයෝගය කටයුතු කිරිම අපේක්ෂා කෙරේ.

යම් අලාභයක් හෝ හානියක් වහාම වාර්තා කළ යුතු අතර, හානියේ ඡායාරූප, අලුත්වැඩියා ඇස්තමේන්තු සහ බලපෑමට ලක් වූ අයිතම සඳහා හිමිකාරීත්ව සාක්ෂි ඇතුළු අදාළ සියලුම උපකාරක ලේඛනද ඉදිරිපත් කළ යුතුය.

## 6. පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම (Complaints and Grievance Handling)

**පියවර 1 - ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස්** (Fairfirst Insurance) ආයතනය අමතන්න:

☎ +94 11 2335167 (පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා)

✉ info@fairfirst.lk

ඔබට පවතින ගැටලු ෆෙයාෆස්ට් (Fairfirst) ආයතනයේ අවදානම් සහ අනුකූලතා (Risk & Compliance) කණ්ඩායම වෙත යොමු කළ හැකිය.

**පියවර 2 - බාහිර පාර්ශව වෙත යොමු කිරීම** (ගැටලුව විසඳී නොමැති නම්):

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL):

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | 🌐 www.ircsl.gov.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (Insurance Ombudsman):

☎ +94 11 2505542 / +94 11 2505041 | ✉ info@insuranceombudsman.lk | 🌐 www.insuranceombudsman.lk

## 7. වැඩි විස්තර සඳහා අප අමතන්න

**ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** (Fairfirst Insurance Limited)

ඇක්සස් ටවර්ස් ii (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

☎ +94 11 2428428 | ✉ info@fairfirst.lk | 🌐 www.fairfirst.lk

## 8. වෙනත් තොරතුරු :

හානිපූරණය (වන්දි ගෙවීම) පදනම් වී ඇත්තේ, කිසිදු අනතුරක් සිදු නොවී තිබුණේ නම් භාණ්ඩවල ඇස්තමේන්තුගත විකුණුම් මිල සහ හානිවීමෙන් හෝ පිරිහීමෙන් පසු ඒවා විකිණීමෙන් ලැබුණු මුදල අතර වෙනස මත ය.

වැඩිදුර පිරිහීම වැළැක්වීම සඳහා පමණක් දරනු ලබන සාධාරණ අතිරේක වියදම්, වළක්වා ගත් හානියේ වටිනාකම දක්වා ආවරණය කළ හැක. වියදම් හෝ කොමිස් වැනි ඉතිරි කරගත් යම් පිරිවැයක් හිමිකම් ගෙවීමේ මුදලින් කපා හරිනු ලැබේ.

රක්ෂිත මුදල භාණ්ඩවල ඇස්තමේන්තුගත විකුණුම් මිලට වඩා අඩු වන අවස්ථාවලදී, රක්ෂණකරුගේ වගකීම සමානුපාතිකව අඩු කරනු ලැබේ.

### වැදගත් සටහන :

IPID ලේඛනය මගින් ප්‍රධාන ආවරණයේ සාරාංශයක් සහ අදාළ නම් අතිරේක ආවරණ සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ සැපයීමට අදහස් කරන අතර, එය ඔබගේ විශේෂිත පුද්ගලික අවශ්‍යතාවලට ගැලපෙන ලෙස සකස් කර නැත. නිෂ්පාදනයේ සම්පූර්ණ හා පුද්ගලීකරණය කළ තොරතුරු සහ බැහැර කිරීම් පිළිබඳ සම්පූර්ණ පූර්ව-කොන්ත්‍රාත්තු සහ කොන්ත්‍රාත්තු නියමයන් ඔබේ ඔප්පුවේ ලේඛනයේ සපයා ඇත. IPID යනු ඔප්පුවේ/කොන්ත්‍රාත්තුවේ කොටසක් නොවනු ඇත. එමනිසා, කිසියම් ගැටුමක් ඇති වූ විට, ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලපැවැත්වේ.